සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

# භූගෝල විද්‍යාව I

**11 ශ්‍රේණිය** **කාලය පැය 01 යි.**

**නම/ විභාග අංකයඃ**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **අංක 01 සිට 10 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියන්න.**

01 භූගතව ඇති උණුසුම් ජලය හඳුන්වනු ලබන්නේ ........................................................ ජලය ලෙසයි. (උල්කා / මැග්මීය / සහජාත)

02 වායුගෝලයේ 50 - 80km උසකින් පවතින්නේ ........................................................ ගෝලය වේ. (තාප / මෙසෝ / අපරිවර්ති)

03 නැගෙනහිර අප්‍රිකාවේ සුවිසේද නිම්නය ................................................ තැටි මායිමක ප්‍රතිඵලයකි. (අභිසරණ / තීර්යක් / අපසරණ)

04 ක්‍රැකටෝවා ගිනිකන්ද අයත්වන්නේ ........................................................................................ ට වේ. (ඉතාලිය / පිලිපීනය / ඉන්දුනීසියාව)

05 ලෝකයේ උසම සානුව ආසියාවේ ........................................................................ සානුව වේ. (පාමීර් / ඩෙකෑන් / ටිබෙට්)

06 තේක්ක හා ........................................ ශාඛ නිවර්තන වනාන්තරවල වැවෙන විශේෂ ශාඛ වේ. (පයින් / ඕක් / හැහෝගනී)

07 කෙවින්ගේ දේශගුණික වර්ගීකරණයෙහි CS වලින් ........................................................ දේශගුණ වර්ගය දක්වා ඇත. (උෂ්ණ කාන්තාර / නිවර්තන වර්ෂා / මධ්‍යධරණී)

08 මීකොං හා අමූර් යනු ........................................................................ ඃපිහිටි ගංගා දෙකකි. (යුරෝපයේ / අප්‍රිකාවේ / ආසියාවේ)

09 ජපානය අවට ඇති අධික සිසිල් බව ඇතැම් කාලවල දී ................................................ ප්‍රවාහය මගින් උණුසුම් කරයි. (ගල්ෆ් / කුරෝසිවෝ / පිලිපීන)

10 ශ්‍රී ලංකාවේ පිදුරුතලාගල කඳුවලට නැගෙනහිරින් ................................................ කඳු පිහිටා ඇත. (නකල්ස් / ලුණුගල / හපුතලේ)

- **අංක 11 සිට 20 දක්වා වූ ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණද, වැරදි නම් (x) ලකුණද යොදන්න.**

11 වාසුළි හා සංවහන මගින් වැඩිපුරම ශ්‍රී ලංකාවේ වැසි ලැබෙන්නේ කඳුරට තෙත් කලාපයටයි. ( )

12 දෙනියාය ප්‍රදේශය ශ්‍රී ලංකාවේ 3000mm ට වඩා වැඩි වැසි ලැබෙන ප්‍රදේශයකි. ( )

13 උතුරු ඇමෙරිකාවේ පිහිටි ඔත්ලහෝමා, කැන්සාස් ප්‍රදේශ තිරිඟු .පටියට අයිතිය. ( )

14 අර්ධ ශුෂ්ක හා උණුසුම් දේශගුණය සත්ත්ව පාලනයට යෝග්‍ය වේ. ( )

15 ඊජිප්තුව හා පාකිස්ථානය කපු වගාව බහුලව කෙරෙන රටවල් ය. ( )

16 සුළු අපනයන භෝග වගාව අයත්වන්නේ ශ්‍රී ලංකාවේ යැපුම් කෘෂිකර්මයට වේ. ( )

17 රත්න, මිද්දෙනිය, ගාල්ල ශ්‍රී ලංකාවේ සුළු පොල් ත්‍රිකෝණයට අයිති ප්‍රදේශයි. ( )

18 ශ්‍රී ලංකාවේ වෙරළ ප්‍රදේශයේ සිට 40km ක් දක්වා වූ ප්‍රදේශය ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තයට අයිතිය. ( )

19 ලෝකයේ ප්‍රමුඛතම කපු පිළි නිෂ්පාදකයා ඉන්දියාව වේ. ( )

20 ජපානයේ කොබේ ප්‍රදේශය යකඩ හා වානේ කර්මාන්තයට ප්‍රසිද්ධය. ( )

- **අංක 21 සිට 30 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තිත් ඉර මත ලියන්න.**

21 ඉන්දියාවේ මුම්බායි, චෙන්නායි ප්‍රදේශ ........................................... නිෂ්පාදන කර්මාන්තයට වැදගත් වේ.

22 නව තාක්ෂණය උපයෝගී කර ගනිමින් ........................................... භාණ්ඩ නිෂ්පාදනය විද්‍යුත් කර්මාන්තයේ විශේෂ ලක්ෂණය වේ.

23 ගුවන් යානා නිෂ්පාදනය සඳහා ........................................................................ ලෝහය වැදගත් අමුද්‍රව්‍යයකි.

24 ශ්‍රී ලංකාවේ ලුණුවිල, පත්තල හා බුත්තල ........................................................................ පිහිටි ප්‍රදේශ වේ.

25 කාර්මික රටක ලක්ෂණයක් ලෙස ඒක ශීර්ෂ දළ ජාතික නිෂ්පාදිතය ................................................ අගයක් ගැනීම දැක්විය හැකිය.

26 පැම්පාස් තෘණබිම ........................................................................ මුළු බිමෙන් 52% ක් පමණ පවතී.

27 ඔටුවා හිතවත් සතෙකු වන ආදි වාසී ජන කණ්ඩායම ........................................................................ වරු වේ.

28 මිනිසා විසින් ලබාගන්නා දැනුම, කුසලතා හා ...................................................... නිසා වටිනා සම්පතක් බවට පත්වේ.

29 ගල් අඟුරු හා ජිප්සම් අයිති වන්නේ ................................................................ පාෂාණ ගණයට ය.

30 නිෆෙරස් ලෝහ වර්ග සමග මිශ්‍ර කර විශේෂිත වානේ වර්ග නිපදවීමට යොදාගන්නේ ........................................................... වේ.

- **අංක 31 සිට 40 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

31 මෙම ප්‍රදේශවලින් රන් සම්පත පිහිටි රටවල් කාණ්ඩය දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) රුසියාව, සුරියනාමය, මැලේසියාව

(2) සැම්බියාව, සයරේ හා චීනයේ මැන්චූරියා ෂාංසි පළාත

(3) ඕස්ට්‍රේලියාවේ කාල්ගුලි, කැනඩාව හා රුසියාව

(4) ඇමෙරිකාවේ කෙන්ටකි ප්‍රාන්තය, මෙක්සිකෝව හා ජැමෙයිකාව

32 මව් පාෂාණය, දේශගුණය, මානුෂ ක්‍රියා සහ දේශගුණය යන කරුණු සඳහා වඩාත් අදාළ වන පිළිතුර කුමක් ද?

(1) පසෙහි අඩංගු ද්‍රව්‍ය වේ. (2) පසෙහි රසායනික ලක්ෂණ වේ.

(3) පාංශු වර්ධනයේ බලපෑම් වේ. (4) පාංශු වර්ධනයට බලපාන සාධක වේ.

33 උතුරු අක්ෂාංශ $50^{o}$ ට ඉහළින් පිහිටි අක්ෂාංශීය ප්‍රදේශවල ව්‍යාප්ත වී ඇති වනාන්තර වර්ගය මින් කුමක් ද?

(1) පතනශීල වනාන්තර (2) කේතුධර වනාන්තර

(3) නිවර්තන වනාන්තර (4) මෝසම් වනාන්තර

34 ශ්‍රී ලංකාවේ ඇපටයිට්, තෝරියනයිට් හා මැග්නටයිට් පිළිවෙලින් ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ අඩංගු පිළිතුර වන්නේ මින් කුමක් ද?

(1) මඩකලපුව, කල්කුඩා, එළුවන්කුලම (2) එප්පාවල, බේරුවල, කොච්චිකඩේ


(3) තිරුක්කෝවිල්, අම්පාර, මූලතිව් (4) පුල්මුඩෙයි, මුරුක්කන්, එළුවන්කුලම

35 තද සුළඟට ඔරොත්තු දෙන අන්දමේ කුරු වූ ශාඛ පවතින්නේ මින් කුමන වනාන්තර කලාපයක ද?

(1) වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර (2) කඳුකර වියළි කලාපීය වනාන්තර

(3) නිවර්තන තෙත් කලාපීය වනාන්තර (4) ශුෂ්ක කලාපීය වනාන්තර

36 මෙහි දැක්වෙන ජන සංඛ්‍යා පිරමීඩය සහිත රටක පවතින ලක්ෂණය අඩංගු පිළිතුර කුමක් ද?




(1) අවුරුදු 15 ට වැඩි යැපෙන්නන් අඩුය.

(2) අවුරුදු 60 ට වැඩි යැපෙන්නන් වැඩිය.

(3) ඉතා අඩු උපත් අනුපාතිකයක් පවතී.

(4) අවුරුදු 60 ට වැඩි යැපෙන්නන් අඩුය.

37 දකුණු ආසියානු රටවල ජන සංඛ්‍යාව අනුව ගත්විට ශ්‍රී ලංකාව පිළිබඳ කිවහැකි වඩාත් සත්‍ය ප්‍රකාශය මින් කුමක් ද?

(1) ජන සංඛ්‍යා ප්‍රමාණය අවරෝහණ ක්‍රමය අනුව පෙළ ගැස්වූ විට ශ්‍රී ලංකාව 5 වන ස්ථානයේ සිටී.


(2) ජන සංඛ්‍යා ප්‍රතිශතයෙන් 75.59% ක් ශ්‍රී ලංකාව සතුය.

(3) වාර්ෂික වැඩිවීමේ ප්‍රතිශතය අනවු වේගයෙන් වර්ධනය වන රටාවක් ඇත.


(4) ජන සංඛ්‍යා ප්‍රමාණය අතින් පාකිස්ථානය හා ශ්‍රී ලංකාව සමාන තත්ත්වයක ඇත.

38 ශ්‍රී ලංකාවේ පිහිටීම පිළිබඳව වඩාත් නිවැරදි සටහන දැක්වෙන්නේ පහත කවර පිළිතුරේදැයි දක්වන්න.


(1)





(2)




(3)




(4)




39 ශ්‍රී ලංකාවේ 1:50000 භූ ලක්ෂණ සිතියම්වල භාවිතා වන සංකේත හතරක් පහත දැක්වේ. ඒවා පිළිවෙලින් අඩංගු වන්නේ කවර පිළිතුරේ ද?




The National e-learning Portal for The General Education

(1) සංචාරක බංගලාව, ගුරු පාර, මුස්ලිම් පල්ලිය, බෝක්කුව

(2) උසාවිය, අප්‍රධාන පාර, පල්ලිය, පාලම

(3) උසාවිය, ගුරුපාර, පල්ලිය, බෝක්කුව

(4) සංචාරක බංගලාව, කරත්ත පාර, තැපැල් කාර්යාලය, බෝක්කුව

40 මෙට්‍රික් සිතියම්වල භාවිතා වන සංස්කෘතික ලක්ෂණ පමණක් අඩංගු වන පිළිතුර කුමක් ද?

(1) පාලම, කඳුවැටිය, අඩිපාර, සානුව

(2) සානුව, කරත්ත පාර, මහා මාර්ගය, නෙරුව

(3) පාලම, අප්‍රධාන පාර, පාසල, බිම්ගෙය

(4) අඩිපාර, බෝක්කුව, රෝහල, උසාවිය $(1 \times 40 = 40)$

සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

# භූගෝල විද්‍යාව II

**11 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- **I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. II කොටසින් ප්‍රශ්න 2 කටත්, III කොටසින් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සැපයිය යුතුය. පිළිතුරු දිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව ප්‍රශ්න 5 කි.**

## I කොටස

01 (අ) ඔබ වෙත සපයා ඇති 1 : 50000 මෙට්‍රික් සිතියම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) සිතියම් ප්‍රදේශයේ භෞතික ලක්ෂණ අනුව වඩාත් නිවැරදි ප්‍රකාශය මින් කුමක් ද? (කඳුකර බිමකි / වෙරළාශ්‍රිත බිමකි / තැනිතලා බිමකි) (ල. 02)

(2) නැගෙනහිර කොටසේ ඇති මංසන්ධි ජනාවාසයේ පවතින රජයේ ගොඩනැගිලි දෙකක් දක්වන්න. (ල. 02)

(3) මෙහි පවතින වගාවන් 2 ක් දක්වන්න. (ල. 02)

(4) මෙම සිතියමට සුදුසු රේඛීය පරිමාණය ඇඳ පෙන්වන්න. (ල. 02)

(5) මෙම ප්‍රදේශයේ ජනාධික බව පෙන්වීමට පවතින සාධකය දක්වන්න. (ල. 01)

(6) බටහිර ප්‍රදේශයට සමාන්තරව පවතින ප්‍රධාන මාර්ගයේ දිග කිලෝමීටර වලින් දක්වන්න. (ල. 01)

(ආ) සපයා ඇති ලෝක ආකෘති සිතියමේ පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න.

(1) කර්කටක නිවර්තන රේඛාව

(2) ඕස්ට්‍රේලියාවේ පිහිටි සෞම්‍ය කලාපීය තෘණ බිම

(3) යකඩ හා වානේ කර්මාන්තය ව්‍යාප්ත වී ඇති දකුණු ඇමෙරිකානු රට

(4) තිරිඟු වගා කරනු ලබන ආසියානු රටක්

(5) උතුරු ඇමෙරිකාවේ ඛණිජ තෙල් පවතින ප්‍රදේශය (ල. 05)

(ඉ) සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමේ පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න.

(1) උතුරු පළාතේ පිහිටි ප්‍රධාන ධීවර බිමක්

(2) රසායන ද්‍රව්‍ය කම්හල පිහිටි ස්ථානය

(3) කඳුකර වියළි කලාපීය වනාන්තර පිහිටි ප්‍රද්ශයක්.

(4) නැගෙනහිර පළාතේ වූ කඩදාසි කම්හල පිහිටි ස්ථානය

(5) දකුණු පළාතේ කජු වගා කරන ප්‍රදේශය (ල. 05)

## II කොටස

02 (1) පහත දක්වා ඇති රටවල සිදුකෙරෙන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ගය දක්වන්න. (ඉන්දියාව / චීනය / කෙන්යාව / මැලේසියාව / ඕස්ට්‍රේලියාව / ඩෙන්මාර්කය)(ල. 03)

(2) කාර්මික නිපැයුම් රාශියකට අවශ්‍ය අමුද්‍රව්‍ය සපයන රබර් වගාව ව්‍යාප්ත වීමට හේතු දෙකක් පැහැදිලි කරන්න. (ල. 02)

(3) 1. වතු කෘෂිකර්මය ආශ්‍රිත විශේෂ ලක්ෂණ 3 ක් පහදන්න. (ල. 03)

2. ලෝක වෙළඳපලේ තිරිඟු ප්‍රධාන භෝගයක් ලෙස වැදගත්වීමට හේතු 2 ක් පැහැදිලි කරන්න. (ල. 02)

03 වර්තමානයේ බොහෝ රටවල කාර්මික භාණ්ඩ නිෂ්පාදනයේ දී එකලස් කිරීමේ ක්‍රියාවලිය විශේෂයෙන් දක්නට ඇත.

(1) එකලස් කිරීමේ කර්මාන්ත යන්න හඳුන්වන්න. (ල. 02)

(2) එකලස් කිරීමේ කර්මාන්තයක් ලෙස මෝටර් රථ නිෂ්පාදන කර්මාන්තය ආසියානු රටවල ශීඝ්‍රයෙන් දියුණුවීමට හේතු තුනක් ලියන්න. (ල. 03)

(3) (a) මෝටර් රථ කර්මාන්තයට වැදගත් වන රටවල් තුනක් දක්වන්න. (ල. 03)

(b) මෝටර් රථ කර්මාන්තයේ ප්‍රවණතා දෙකක් පහදන්න. (ල. 02)

04 ලෝකයේ ජනගහනය මිලියන 100 ට අධික රටවල් රාශියක් වර්තමානයේ දක්නට ඇත.


(1) ලෝකයේ ඉහළම ජන සංඛ්‍යාවක් ඇති රටවල් 6 පිළිවෙලින් දක්වන්න. (ල. 03)

(2) ලෝකයේ ජන ව්‍යාප්තිය අනුව ජන හීන හා ජනාධික කලාප 2 බැගින් නම් කරන්න. (ල. 04)

(3) ජන ව්‍යාප්තියට බලපාන සාධක ඇසුරින් ජනාධික බවට හේතු 3 ක් විස්තර කරන්න. (ල. 03)

## III කොටස

05 ශ්‍රී ලංකාවේ දේශගුණය හා පසේ ස්වභාවය අනුව බෙදා ඇති වනාන්තර කලාප දකුණුපස දී ඇති සිතියමේ දක්වේ.




(1) එහි අංක 1 සිට 6 දක්වා පවතින එම කලාප අංක අනුව නම් කරන්න. (ල. 03)

(2) එහි අංක 1 හා 2 කලාපවල පවතින වෙනස්කම් 2 ක් එහි දේශගුණික ලක්ෂණ අනුව පැහැදිලි කරන්න.

(ල. 04)

(3) අංක 5 කලාපයේ දේශගුණය අනුව ශාක හැඩගැසී

ඇති ආකාරය උදාහරණ දෙමින් පහදන්න.

(ල. 03)

06 ශ්‍රී ලංකාවේ ආර්ථිකය සංවර්ධනය කිරීමේ දී ඛණිජ සම්පත් වැදගත් වන අතර කර්මාන්ත සඳහා අමුද්‍රව්‍යයක් ලෙස ඛණිජ බහුලව භාවිතා කරයි.

(1) පහත සඳහන් ඛණිජ පිහිටි ස්ථාන අනුව පවතින ඛණිජ වර්ග දක්වන්න.

මයිකා / රූටයිල් / හිරිගල් / කෙඔලින් / ඉල්මනයිට් / සිලිකා වැලි (ල. 03)

(2) ඉහත ඛණිජ සම්පත් දෙකක් තෝරාගෙන ඒ මගින් කෙරෙන කර්මාන්ත දක්වන්න.(ල. 03)

(3) 1. ඛණිජ සම්පත් කැණීමෙන් සිදුවන පාරිසරික හානි තුනක් දක්වන්න. (ල. 02)


2. ඛණිජ සම්පත් භාවිතයට ගැනීමේ දී පාරිසරික හානි අවම කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග 3 ක් විස්තර කරන්න. (ල. 02)

07 ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ විශාලත්වය දිනෙන් දිනම ඉහළ යමින් පවතින අතර 1871 මිලියන දෙකක් වූ ජන සංඛ්‍යාව 2001 වන විට මිලියන 19 ක් ද, 2014 වන විට මිලියනයක ජන සංඛ්‍යාවක් ද දක්නට ඇත.

(1) රටක ජන ඝනත්වය ගණනය කරන ආකාරය දක්වන්න. (ල. 03)

(2) ශ්‍රී ලංකාවේ ජන ඝනත්වය අනුව වැඩිම දිස්ත්‍රික්ක 5 පි

(3) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා වර්ධනය කෙරෙහි බලපා ඇ ත් ජන සංඛ්‍යා වර්ධනය පිළිබඳ පැහැදිලි කරන්න.




08 ශ්‍රී ලංකාවේ වර්ග කිලෝමීටර 21756 ක් වූ නොගැඹුරු මහාද්වීපික තටාකය ද, අභ්‍යන්තර ජලාශවල ව්‍යාප්තිය ද නිසා කරදිය මෙන්ම මිරිදිය ධීවර කර්මාන්තය ද කැපී පෙනේ.

(1) සිතියමේ A හා B ලෙස පෙන්වා ඇති කිවුල් දිය මසුන් බෝකරන මධ්‍යස්ථාන දෙකද, C, D, E, F වලින් දැක්වෙන ධීවර වරායන් ද අක්ෂර අනුව නම් කර දක්වන්න. (ල. 03)

(2) අංක 1 සිට 6 දක්වා ඇති මිරිදිය මසුන් බෝකරන මධ්‍යස්ථාන දක්වන්න. (ල. 03)

(3) කරදිය හා මිරිදිය ධීවර කර්මාන්තය ආශ්‍රිත ලක්ෂණ දෙක බැගින් දක්වා ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය ආශ්‍රිත ගැටළු දෙකක් පැහැදිලි කරන්න. (ල. 04)

The National e-learning Portal for The General Education

**11 ශ්‍රේණිය - භූගෝල විද්‍යාව**

(01) (ආ) ප්‍රශ්නයට අදාළ ලෝක ආකෘති සිතියම




**11 ශ්‍රේණිය - භූගෝල විද්‍යාව**

(01) (ඉ) ප්‍රශ්නයට අදාළ ශ්‍රී ලංකා ආකෘති සිතියම

